**මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය.

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලෝක බැංකු අන්තර් ගම්මාන ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වටිනාකම රු. 34,370,848 ක් වූ සතිපොල 2 ක් සහා වාහන නවතා තැබීමේ ස්ථානය සහ වාහන සේවා කිරීමේ ස්ථානය ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) බොබ්කැට් යන්ත්‍රය සඳහා මිලදී ගත් රු. 540,014 ක් වටිනා උපකරණ, සහා ගබඩාවේ ගබඩා කර තිබුණු නමුත් මූල්‍ය ප්‍රකාශනවල ගබඩා තොග වශයෙන් දක්වා නොතිබුණි.

(ඇ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද, විවේකාගාරයේ වටිනාකම රු. 1,066,890 ක් වත්කම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) රථ වාහන සේවා කිරිමේ මධ්‍යස්ථානය සඳහා මිලදී ගෙන තිබුණු සේවා ද්‍රව්‍යවලින් සමාලෝචිත වසර අවසානයට වූ ඉතිරි තොග වටිනාකම හඳුනාගෙන, ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත රජයෙන් ලබාදී තිබුණු ජල බවුසරයේ හා කැබ් රථයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2012 නොවැම්බර් 10 දින ආරම්භ කරන ලද ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන අන්තර් ගම්මාන ව්‍යාපෘතියට අදාල ඉදිරි මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා වූ ඉතිරි කිරීමේ ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු. 1,404,860 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(උ) 2013 වර්ෂයේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර මෙහෙයුම් ආදායම්, රු. 235,350 ක්, සමාලෝචිත වර්ෂයේ ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට පෙර සභාව වෙත ලැබී තිබුණු ජල බවුසර් 03 ක්, ට්‍රේලර් 03 ක්, ට්‍රැක්ටර් යන්ත්‍රයක්, ටිපර් රථයක්, මාර්ග තලනයක්, මෝටර් බෝට්ටුවක් සහ පාපැදි 04 ක වටිනාකම් හඳුනාගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

---------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 90,341,080 ක් වූ ගණුදෙනු විගණයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නිරවුල් නොකළ ගිණුම්

----------------------------

කර්මාන්ත ණයගැති හා ණයහිමි ශේෂයන් පිළිවෙලින් රු. 6,647,799 ක් හා රු. 7,500,814 ක් 2015 ජුනි මස වන විටත් නිරවුල් කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

--------------------

(අ) සභාවේ යන්ත්‍රෝපකරණ මගින් සේවා ලබාගත් සභිකවරුන් 06 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.454,680 ක්, ලේඛනගත කර නොතිබුණු අතර 2015 ජුනි වන විටත් අයවී නොතිබුණි.

(ආ) වර්ෂ 6 ත් 20 ත් අතර කාලයක සිට නිරවුල් කර ගැනීමකින් තොරව, මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පෙන්වා තිබුණු, ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක එකතු වටිනාකම රු. 1,164,454 ක් විය.

1.3.5 අනුකූල නොවීම්

------------------

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| | ------------------------------- | ------------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>---------------------------------------- | |
| (i) | 129(2) (ආ) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැසියන් විසින් ගෙවනු ලැබූ  සියළුම මුද්දර ගාස්තු වල මුදල් ප්‍රමාණය හා ගාස්තු ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු වුවද, රු. 4,294,350 ක මුදලක්  අදාල බලධාරින්ගෙන් අයකරගෙන  නොතිබුණි. |
| (ii) | 132 ඒ වගන්තිය | 2014 වර්ෂයේදී ජනාධිපතිවරයාගේ පැමිණීම වෙනුවෙන් උත්සව කටයුතු සඳහා සෘජු වියදම් ලෙස රු.193,160 ක් සභා අරමුදලින් වැයකර තිබුණු අතර විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණේ රු. 100,000 ක වියදමක් සඳහා පමණි. |
| (ආ) | 203 වන අධිකාරිය මෝටර් වාහන පනත 2(1) වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී සභාව සතුව පැවති කෘ කැබ් රථයක්, ටේලර් 03 ක්, කියුබ් 2 ටිපර් රථයක් සහ ජල බවුසර් 05 ක් මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොමැතිව ධාවනයේ යොදවා තිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>---------------------------- | |
| | රීති අංක 203,214 හා 218 | සභාවේ දේපල සම්බන්ධව පූර්ණ සමීක්ෂණයක් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අති විශේෂ ගැසට් නිවේදනයේ 1(iii) රීතිය | ප්‍රාදේශීය සභාවට වාහනයක් නොමැති අවස්ථාවක පළාත් පාලන කොමසාරිස්වරයාගේ අවසරය ලබාගෙන පෞද්ගලික වාහන සඳහා වියදම් දැරිය හැකි නමුත් එසේ අවසරය ලබා නොගෙන අවස්ථා 13 කදී රු. 131,500 ක්, පෞද්ගලික වාහන සඳහා වැයකර තිබුණි. |
| (ඉ) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03<br>---------------------------------- | |
| | 3.1 | සභාවට අයත් රජයේ ඉඩම් සහ ගොඩනැගිලි සඳහා හිමිකම් පත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | 3.6 හා 3.7 | සියළුම වත්කම් පිලිබඳ වාර්ෂික සමීක්ෂණයක් පැවැත්වීම සහ නියමිත ප්‍රමාණය තිබේදැයි සොයා බැලීමට වර්ෂ කිහිපයකට වරක් ඉඩම් මැනීම කළයුතු අතර ඉඩම්වල මායිම් ලකුණු කර ඒවායේ මායිම් තහවුරු කරණු පිණිස ඒ වඩා කම්බි වැටවල් සවිකිරීමද සිදුකළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**02. මූල්‍ය සමාලෝචනය.**

**---------------------------**

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,040,603 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,864,658 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

---------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | '000 | '000 | '000 |
| (i) වරිපනම් හා බදු | 783 | 640 | 2,236 |
| (ii) බදු කුලී | 15,591 | 8,551 | 195 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,520 | 1,404 | - |
| (iv) වෙනත් ආදායම් | 109,734 | 28,075 | 31,518 |

2.2.2 වරිපනම් බදු

------------------

සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල වරිපනම් බදු ආදායම රු. 640,311 ක් වූ අතර දෙසැම්බර් 31 දිනට හිඟය රු. 2,236,042 ක් වූයෙන්, ආදායම් හිඟය සභාවේ වාර්ෂික ආදායම මෙන් 349% ක් විය. මේ අනුව වරිපනම් ආදායම් අයකර ගැනීමේ දුර්වල තත්ත්වයක් නිරික්ෂණය විය.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල රු. 3,557,586 ක්ද, මුද්දර ගාස්තු රු. 4,294,350 ක්ද විය.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1. නිෂ්කාර්ය / ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

සභාවේ පහත සඳහන් වත්කම් ඒවායේ ඉදිරියෙන් දක්වා ඇති කාල සීමාව තුළ සිට නිෂ්කාර්යව පවතින බව නිරික්ෂණය විය.

| වත්කම් විස්තරය | වටිනාකම | නිශ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|
| | රු. | |
| සහල් පිටි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල | 1,800.000 | අවු. 05 |
| මිට්ෂුබිසි කැබ් රථය | 180,000 | අවු. 06 |
| සහල් පිටි නිෂ්පාදන උපකරණ කට්ටලය | 650,500 | අවු. 07 |
| කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍රය | 240,000 | අවු. 02 |
| බ්ලොක් ගල් යන්ත්‍රය | 130,862 | අවු. 02 |
| මාර්ග තලනය | වටිනාකම දක්වා නැත | මාස 08 |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) සභාවට අයත් ආපන ශාලා ගොඩනැගිල්ල කුලියට ලබාගත් පාර්ශවය විසින්, ගිවිසුම් ප්‍රකාරව ආපන ශාලාව 2013 වර්ෂයේ සිට පවත්වා නොතිබුණු නමුත් සභාව විසින් එය ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු තැන්පතු තුළ ඇතුළත් රු. 3,014,210 ක් 2010 හා 2011 වර්ෂයන්හි සිදු කරන ලද ව්‍යාපෘතීන් 38 කට අදාල, අත රැදවුම් මුදල් නිරවුල් කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 3.3 අයවැය පාලනය

වාහන හා යන්ත්‍ර කුලියට දීම, ජල ගාස්තු, ලියාපදිංචි සහතික හා පරික්ෂණ ගාස්තු, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම, විනෝද බදු හා අයකරගත හැකි ගාස්තු යන උප ආදායම් විෂයයන් වලට අදාල අයවැයගත හා තථ්‍ය ආදායම අතර සියයට 30 ත් සියයට 100 අතර විචලනයක් පැවතුණි.

## 3.4 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්හි සභාව තුළ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින්ද ප්‍රමාණවත් විගණනයක් ප්‍රාදේශීය සභාව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය